මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**
14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வதுமாடி, சுகுறுபாய, பத்தரமுல்ல, இலங்கை.
14th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசு / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දුර./ தொ./ Tel : 011 2868145; ෆැක්ස්/ பெ./ Fax : 011 2868135

දිනය / திகதி / Date: **2023/06/22**

# විශේෂ මාධ්‍ය නිවේදනයයි.

සියලුම මාධ්‍ය ප්‍රධානීන් වෙත,

**<u>දකුණේ හා බස්නාහිර කුළී මිනීමරුවන්ට ඇමැති අණින් දැල එලයි!</u>**

බස්නාහිර පළාත සහ දකුණු පළාත තුල සිදුවන මිනීමැරුම් සම්බන්ධයෙන් වහාම දැඩි ක්‍රියාමාර්ග ගන්නයි

මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් විසින් පොලිස් ප්‍රධානීන්ට නියෝගකර ඇත.

ඔහු එවැනි නියෝගයක් ලබාදී ඇත්තේ, පොලිස් ප්‍රධානින් කැඳවා ඊයේ (21) සිදුකල සාකච්ජාවකදීය.

එම සාකච්ජාව සඳහා මහජන ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වියානි ගුණතිලක, පොලිස්පති ඩී.සී.වික්‍රමරත්න, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්, දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්.සී මැදවත්ත, විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර සහභාගී වී තිබිණ.

මිනීමරුවන් සම්බන්ධයෙන් නිතිය තදින් ක්‍රියාකරන ලෙස එහිදී පොලිස්පතිවරයාට නියෝගකර ඇති අමාත්‍යවරයා, එවැනි මෙහෙයුම්වලදී අනිසි බලපෑම් සිදුකිරීමට කිසිවකුට හෝ ඉඩ නොතබන බව අවධාරණය කර ඇත්තේ, ජනාධිපතිවරයාගෙන් ඒ සම්බන්ධයෙන් සහතිකයක් ලැබී ඇතැයි ද පවසමිනි.

බලපත්‍රයක් නොමැති හෝ බලපත්‍ර අලුත් නොකරන ලද ගිනි අවි පොලිසියට බාර ගැනීම සඳහා ජුලි 31 දිනය දක්වා පොදු සමාකාලයක් ප්‍රකාශකරන ලෙස දැනුම්දී ඇති අමාත්‍යවරයා, ගිනි අවි බාරදීමේ පොදු සමා කාලය අවසන් වීමත් සමඟ පොලිසිය අනෙකුත් බුද්ධි අංශ සමඟ නීති විරෝධී ගිනි අවි වැටලීම ආරම්භ කරන්නැයි දැනුම්දී ඇත.

අතිරේක ලේකම් (පාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration)
දුර./ தொ./ Tel : 011 2887576
ෆැක්ස්/ பெ./ Fax : 011 2887756

අතිරේක ලේකම් (සංවර්ධන) / மேலதிக செயலாளர் (அபிவிருத்தி) / Additional Secretary ( Development)
දුර./ தொ./ Tel : 011 2887417
ෆැක්ස්/ பெ./ Fax : 011 2887883

ප්‍රධාන මූල්‍ය නිලධාරී / பிரதான நிதி அதிகாரி / Chief Financial Officer
දුර./ தொ./ Tel : 011 2887396
ෆැක්ස්/ பெ./ Fax : 011 2887636

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
Ministry of Public Security
14 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
14 வதுமாடி, சுகுறுபாய, பத்தரமுல்ல, இலங்கை.
14th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන / தொலைபேசி / Telephone: 011 2886067, 011 2887268, 011 2887307
ෆැක්ස් / பெ. / Fax: 011 2887756, 011 2887238
ලේකම් / செயலாளர் / Secretary: දුර./ தொ./ Tel : 011 2868145; ෆැක්ස්/ பெ./ Fax : 011 2868135

දිනය / திகதி / Date: 2023/06/22

දකුණු පළාතේ හා බස්නාහිර පළාතේ මිනීමැරුම් හා අපරාධ වැඩිවීමට විශේෂයෙන්ම බලපා ඇත්තේ එම පළාත් දෙකෙහි සේවයකරන ඇතැම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ හා පොලිස් ස්ථානාධිපතිවරුන්ගේ අකර්ශක්ෂමතාවය බව පොලිස්පතිවරයා මෙහිදී පෙන්වා දී ඇති අතර එහිදී අමාත්‍යවරයා පවසා ඇත්තේ එවැනි නිලධාරීන් වහාම ඉවත්කර සුදුසු නිලධාරීන් පත්කරන ලෙසයි

අකිල තෙන්නකෝන්
මහජන ආරක්ෂක අමාත්‍ය මාධ්‍ය ලේකම්
මහජන ආරක්ෂක අමාත්‍යාංශය
0766039563